# පනින්න පෙර සිතා බලමු



ප්‍රභංසි තිනුලි ධීෂණා දෙහිගොල්ල

# පනින්න පෙර සිතා බලමු

ප්‍රභංසි තිනුලි ධීෂණා දෙහිගොල්ල

කතෘගේ වෙනත් කෘති

ගිරා රංචුව

කතෘ ප්‍රකාශනයකි

සියලුම හිමිකම් කතෘ සතුය

ISBN 978-624-208-059-8

2023.12.11

# පිදුම

මාගේ මෙම පොත ලිවීමට මා හට උදව් කළ

4-C ශ්‍රේණියේ ප්‍රියන්ති ජයසේකර

ගුරුමෑණියන්ටත්

මා දිරිගැන්වූ මාගේ දෙමාපියන්ටත්

මගේ ළඟින්ම සිට උදව් කළ මාගේ අක්කීටත්

මට උදව් කළ යහළුවන්ටත්

ඉතා ආදරයෙන් පුදමු.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාටර් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාථර්නා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20

එකමත් එක කාලෙක අලි පැංචයි හා පැංචයි හරි හොඳ යාළුවෝ වෙලා සිටියා. මේ දෙදෙනා සැම දින ම වනාන්තරයේ මැද තිබුණු ගහ ළඟදී හමු වුණා. යහළුවා කැමති කෑමක් රැගෙන යෑමට මේ දෙන්නාම පුරුදු වී සිටියා. “අද මම මොනවද අලි පැංචාට ගෙනියන්නේ? අලි පැංචා ඇවිත්ද දන්නේ නෑ? ඇපල් ගහ ළඟට යන්න ඕනේ,” හා පැංචා සිතුවා. හා පැංචා ඇපල් ගහ ළඟට ගිහින් ඇපල් ගෙඩියක් තියෙනවාදැයි බැලුවා. “



අර තියෙන්නේ හොඳට ඉදුණු ඇපල් ගෙඩියක්, මේක අරගෙන ගිහින් අලි පැංචාට දෙනවා. අලි පැංචා අද සතුටින් ඇපල් කයි.” හා පැංචා සිතුවා. හා පැංචා ඇපල් ගෙඩිය අරගෙන  ලා.... ලල්ල.. ලා.... කියමින් උඩ පනිමින් ඇපල් ගෙඩිය උඩ දම දමා ගියා.



“හපොයි දෙයියනේ! ඇපල් ගෙඩිය ගඟට වැටුණා. දැන් මම මොකද කරන්නේ? ගඟට පනින්න වෙයි වගේ.”



හා පැංචා දෙවරක් නොසිතා ගඟට පැන්නා. හා පැංචා පීනාගෙන යන විට ගඟේ ගැඹුරු තැනකින් ගිලෙන්න ගියා.



හා පැංචා හයියෙන් කෑ ගැසුවා. මේ සද්දෙ අලි පැංචාට ඇහුණා. අලි පැංචා ගඟ ළඟට ආවා.



අලි පැංචා දැක්කා හා පැංචා ගිලෙන්න යනවා.අලි පැංචා කැරට් ටික අත ඇරලා ගඟට බැහැලා හා පැංචාට හොඬය දිගු කළා.




හා පැංචා හොඬවැලේ එල්ලී ගොඩට ආවා.


"හා පැංචෝ ඔයා මගේ පිට උඩට නගින්න." අලි පැංචා කිවුවා. හා පැංචා අලි පැංචාගේ පිටට නැග්ගා. අලි පැංචා පීනාගෙන ඇපල් ගෙඩිය ළඟට ගියා.



ඇපල් ගෙඩිය ගල් අස්සේ හිරවෙලා තිබුණා.අලි පැංචා හා පැංචාව ඇපල් ගෙඩිය ළඟට හොඬවැලෙන් ලං කළා. හා පැංචා ඇපල් ගෙඩිය ගත්තා.



අලි පැංචා හා පැංචාව පිටට ගත්තා. ආයෙත් පීනගෙන ගඟෙන් එගොඩට ගියා.



“මාව බේරා ගත්තාට බොහෝම ස්තූතියි!” හා පැංචා අලි පැංචාට ස්තූති කළා.

“හා පැංචෝ මින් පස්සේ නම් ඔය වගේ අවදානම් වැඩ කරන්න එපා. හැම දෙයක්ම කරන්න කලින් දෙවරක් සිතා බලන්න. අර කියමනකුත් තියෙනවා නේද? පනින්න පෙර සිතා බලමු කියලා මගේ යාලුවේ ඒ නිසා හොඳට සිතා බලා වැඩ කරමු. නැත්නම් මට යාළුවෙක් නැතිවෙයි.” අලි පැංචා කිවුවා.

අලි පැංචයි හා පැංචයි ගෙනා කෑම බෙදාගෙන සතුටින් කෑවා.



ස්තූතියි!



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථීක පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම, ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20